**කොත්මලේ ප්‍රාදේශීය සභාව - 2023**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කොත්මලේ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කොත්මලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. **මා විසින් තවදුරටත්,**

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ සම්පිණ්ඩන වාර්තාවේ 1.2.3 ඡේදයේ නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුඩළුඔය ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ වටිනාකම රු.19,780,200 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණි. | 2024 ගිණුම සැකසීමේදී නිවැරදි කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයේ ඉදිකිරීම් පවරා වැඩ ආරම්භ නොකළ ව්‍යාපෘති 03 ක රු.2,425,170 ක් තවදුරටත් ණයහිමියන් යටතේ ගිණුම් ගත කර තිබූ අතර ව්‍යාපෘතියක ණයගැති වටිනාකම රු.24,972 ක් අඩුවෙන් දැක්විණි. | - එම - | - එම - |

1.6.2. නොසැසඳුනු පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් දිනට මූල්‍ය ප්‍රකාශ වල දැක්වෙන ගිණුම් ශේෂ 07 ක ශේෂයන් ඊට අදාල උපයෝගී ලේඛන සමඟ සැසැඳීමේදී රු.5,181,533 ක නොසැසඳීමක් පැවතුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | නොසැසඳීම් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

1.6.3. විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යන්ත්‍රෝපකරණ යටතේ දක්වා තිබුණු රු.77,870 ක ශේෂයට අදාල ලිපිගොනු හා උපලේඛන විගණනයට ඉදිරිපත් නොවුණි. | 2024 වර්ෂයේදී අයිතමයන් හඳුනාගෙන ඇතුලත් කිරීමට කටයුතු කරන බව | අදාළ ලිපිගොනු හා උපලේඛනය ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

1.7 අනුකූල නොවීම්

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| 49 (අ) වගන්තිය | ප්‍රාදේශීය සභා පාරක ගොඩනැගිලි සීමාව තුළ සිදු කරන ඉදිකිරීම්වලට අදාළ සැලසුම් 19 ක අදාල පාර්ශවයන් සමඟ නිර්වන්දි ගිවිසුම්වලට එළඹ නොතිබුණි. | නොතාරිස් මාර්ගයෙන් දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නිර්වන්දි ගිවිසුමක් ලෙස සකස් කර ලියාපදිංචි කිරීමට කටයුතු කරන බව | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| 154 (1) වගන්තියට | පෞද්ගලික සමාගමක් විසින් වෙන්දේසියේ විකුණන ලද ඉඩම් කොටස් 37කින් විකුණුම් මත අය කළයුතු සියයට 01 බදු රු. 440,264 ක් අඩුවෙන් අයකර තිබුණි. | බිම් කොටස් කිහිපයක් මිලදී ගැනීම වැනි හේතු මත ඉතිරි බිම් කොටස් සඳහා 1% ගෙවීම් සිදු නොකළ බවත් 2024.02.12 ලිපිය මඟින් සභාවට දැනුම් දී ඇති බව | හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.55,828,777 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.34,496,669 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තු ගත ආදායම | 2023 බිල්කළ ආදායම | 2023 රැස්කළ ආදායම | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2023 ඇස්තමේන්තු ගත ආදායම | 2023 බිල් කළ ආදායම | 2023 රැස්කළ ආදායම | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 19,939,000 | 16,749,870 | 14,198,053 | 6,805,497 | 11,725,500 | 9,716,533 | 9,546,462 | 4,253,680 |
| (ii) | කඩ කුලී | 11,629,000 | 9,790,886 | 9,443,236 | 3,393,610 | 7,532,800 | 1,509,818 | 1,194,568 | 3,045,960 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 14,398,500 | 13,194,254 | 13,194,254 | | 11,291,000 | 10,649,464 | 10,649,464 | - |
| (iv) | වෙනත් ආදායම් | 95,269,000 | 88,648,333 | 95,232,603 | 13,452,356 | 81,555,000 | 15,294,335 | 16,537,508 | 6,584,270 |
| | | 141,235,500 | 128,383,343 | 132,068,146 | 23,651,463 | 112,104,300 | 37,170,150 | 37,928,002 | 13,883,910 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් බදු** | | |
| සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට සභාව විසින් අය කර ගත යුතුව පවතින වරිපනම් බදු හිඟය රු.3,035,563 ක් වන අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉන් රු.1,516,126 ක් හෙවත් සියයට 50 ක ප්‍රමාණයක් පමණක් අයකර ගෙන තිබුණි. මෙම හිඟය තුළ වසර | වසර 05ට වැඩි හිඟ වරිපනම් සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගෙන අයකිරීමට ඉදිරියේදී කටයුතු කරන බව | හිඟ ආදායම් අය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 05 කට වඩා වැඩි කාලයක සිට වරිපනම් පරිශ්‍ර 293 කින් අයවිය යුතු රු. 837,851 ක ශේෂයද, වසර 01 ත් 05 ත් අතර වරිපනම් පරිශ්‍ර 1152 කින් අයවිය යුතු රු.263,879 ක ශේෂයක්ද පැවතුණි. | | |
| (ආ) | වෙනත් ආදායම්<br>------------------ | | |
| i. | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට පැවති රු.869,675 ක හිඟ ජල ගාස්තු වලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.631,610 ක එනම් සියයට 72 ක හිඟයක් පැවතුණි. සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති හිඟ ශේෂය තුළ වසර 01 ට අඩු හා වසර 01 ත් වසර 05 ත් අතර කාල පරාසයකට අදාළ ඒකක 85 කින් රු.1,545,634 ක් අයකර නොතිබුණි. | ජල ගාස්තු අය කිරීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු කරගෙන යමින් පවතින බව | - එම - |
| ii. | සංචාරක අධිකාරියේ අනුමත හෝටල් 03 කින් සියයට 1 බදු ආදායම් අයකර නොතිබුණි. | 2024 වර්ෂයේ සිට ගාස්තු අය කිරීමට කටයුතු කරන බව | - එම - |
| iii. | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට පැවති රු.2,971,460 ක ත්‍රී රෝද රථ ගාස්තු හිඟයෙන් සමාලෝචිත වර්ෂයේ අය කිරීම සියයට 36 ක් වැනි අඩු මට්ටමක පැවති අතර , සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා බිල්කිරීම් වූ රු.2,286,000 න් රු.830,550ක් පමණක් අය කරගෙන තිබුණු අතර එයද සියයට 36 ක් වැනි ඉතාම අඩු අගයක් ගෙන තිබුණි. | හිඟ අයකර ගැනීම සඳහා මේ වනවිට නඩු පැවරීමට කටයුතු සිදු කරමින් පවතින බව | - එම - |
| (ඇ) | උසාවි දඩ හා මුද්දර ගාස්තු<br>----------------------------- | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබුණු මුද්දර ගාස්තු රු. 10,863,360 ක් විය. | හිඟ මුදල් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | ලැබිය යුතු ආදායම් ගෙන්වා ගත යුතුය. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | “ සේව් ද විල්ඩ්‍රන් ව්‍යාපෘතිය ”මගින් මල්දෙණිය හා පුඩළුඔය පුස්තකාල දෙක සඳහා ඉගෙනුම් මධ්‍යස්ථාන පවත්වාගෙන යාමට අවශ්‍ය ලිපිද්‍රව්‍ය, ලැප්ටොප් පරිගණක,මල්ටි මීඩියා ෆොටෝකොපි යන්ත්‍ර හා කාර්යාල උපකරණ පරිත්‍යාග ලෙස ඉකුත් වර්ෂයේ ජනවාරි 08 දින ලබා දී තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනය වන විටත් අදාළ ව්‍යාපෘතිය ආරම්භ නොකර ලැබී තිබූ කාර්යාල උපකරණ වෙනත් කාර්යයකට යොදාගෙන තිබුණි. | දැනට ප්‍රධාන කාර්යාලයේ පුස්තකාලයේ පුස්තකාලාධිපති භාරයේ එම පරිගණකය පවතින බව. | ව්‍යාපෘතිය ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | දුනුකේදෙණිය ගම්මැද්ද පානීය ජල ව්‍යාපෘති සඳහා 2021 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලයක් තුළ ව්‍යාපෘති 3 ක් යටතේ රු.4,000,000 ක් වැයකර තිබුණද, ජල මෝටරය සඳහා තෙකලා විදුලිය ලබා ගෙන නොතිබීම හේතුවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකිවී තිබුණි. | විදුලි බළ හා බලශක්ති අමාත්‍යාංශය වෙත ලිපියක් යොමුකරඇති බව. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති වටිනාකම ගණනය නොකළ යන්ත්‍ර උපකරණ 07 ක් හා ලී බඩු හා කාර්යාල උපකරණ 04 ක් හා වාහන 02 ක් වසර 01 සිට වසර 21 දක්වා කාල පරාසයක සිට නිශ්ක්‍රියව හා ඌන උපයෝජිතව පැවතුණි. | 2024 වර්ෂයේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව | උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුස්තකාල ගොඩනැගිල්ලි, කඩකාමර හා සභාවේ නිවාස ඇතුළු ගොඩනැගිලි 14 ක් නඩත්තුවකින් තොරව විනාශ වීමට ඉඩ හැර තිබුණි. | කළමනාකරණ කමිටුව හරහා ලබාගත් යෝජනා පරිදි ඉදිරි කටයුතු සිදුකිරීමට කටයුතු කරන බව. | ගොඩනැගිලි නිසි පරිදි නඩත්තු කළ යුතුය. |
| (ආ) | 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනතේ 22 (1) හා (2) නියමයන් අනුව අනු බෙදුම් කර තිබුණු ඉඩමකින් අක්කර 03 රූඩ් 01 පර්චස් 19.57 ක වපසරියක් සමන්විත ඉඩම් කොටස්වල අයිතිය පවරාගෙන නොතිබුණි. | අදාළ ඔප්පු කෙටුම්පතෙහි ලියාපදිංචි පිටපත කඩිනමින් ලබාගැනීමට කටයුතු කරන බව | ඉඩම්වල අයිතිය තහවුරු කර ගත යුතුය. |
| (ඇ) | සභාව පරිහරණය කළ වාහන 05 ක් ධාවන තත්ත්වයේ නොපවතින අතර මින් වාහන 03 ක් අළුත්වැඩියාවට යොමු කර වසර 01 සිට වසර 02 ½ ට වැඩි කාලයක් ගත වී තිබුණද, මෙතෙක් අළුත්වැඩියා කොට සභාව වෙත ලබාගෙන නොතිබුණි. වාහන 02 ක අයිතිය සභාවට පවරා ගෙන නොතිබුණි. | අයිතිය පවරා ගැනීමට කටයුතු කරන බව. | අයිතිය පවරා ගත යුතු අතර අළුත්වැඩියා කර නඩත්තු කළ යුතුය. |

3.4 දෘශ්‍ය අක්‍රමිකතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හෙල්බොඩ උප කාර්යාලයේ කම්කරු තනතුරේ සේවයේ නියුතු සේවකයකු සමාලෝචිත වර්ෂයේ උප කාර්යාලය බල ප්‍රදේශයේ පිහිටා ඇති වෙළඳ ව්‍යාපාරවලින් කුවිතාන්සි නිකුත් නොකර බලපත්‍ර ගාස්තු රු.317,559 ක් අයකර සභා අරමුදලට බැර කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් මු.රේ 104 (3) හා 104 (4) පරීක්ෂණ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාත් අවසන් කර නොතිබුණි. | වංචාව සම්බන්ධයෙන් එම නිලධාරියා පිළිබඳව මූලික පරීක්ෂණයක් සිදු කරගන යනු ලබන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

3.5 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සභාව සඳහා අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 10 ක පුරප්පාඩු 19 ක් පැවතුණි. | රාජ්‍ය ප්‍රතිපත්ති වලට අනුකූලව බඳවාගැනීම් තාවකාලිකව අත්හිටුවා ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතුය. |
| (ආ) | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 අයවැය චක්‍රලේඛනයේ 1.1.7 ඡේදය අනුව ස්ථාන මාරු වී ගිය මාස 09 ත් අවුරුදු 01 ත් අතර කාල පරායසයක් තුළ අයවිය යුතු නිළධාරීන් පස්දෙනෙකුගේ රු. 663,810 ක ණය ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වනවිට අදාළ නිලධාරීන්ගේ ණය ශේෂ නිරවුල් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2015 වර්ෂයේ ගුරු සේවයට මුදාහැර ඇති නිළධාරීන් දෙදෙනෙකුගෙන් එකතුව රු.186,110 ක ණය ශේෂය අයකරගෙන නොතිබුණි. | හැටන් අධ්‍යාපන කලාපය මඟින් එය නිරවුල් කිරීමට කටයුතු සිදු කරමින් පවතින බව . | ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |